# කම්මැලි කූඹියා



තිසල දිනුලක වීරසිංහ

# කම්මැලි කූඹියා

## තිසල දිනුලක වීරසිංහ

(7 ශ්‍රේණිය )

කතෘගේ පළමු එළිදැක්වීමයි

මහ / ශාන්ත සිල්වෙස්තර විදුහල,

මහනුවර.

කෘතිය එළ කරන දිනය : 2025.02.08

**ISBN අංකය : 978-624-208-686-6**

# පිදුම

ග්‍රන්ථකරණය කෙරෙහි මා හට උනන්දුවක් ඇති කළ
මගේ ආදරණීය දෙමාපියන්ටත්,
මගේ කෘතිය රචනයේදී මා හට සහයෝගය ලබා දුන්
මගේ නැගණියටත් ,
මගේ අධ්‍යාපන දිවියේ මුලකුරු කියාදෙමින් මාව නිසි
මගට යොමු කරන මගේ විදුපියසේ විදුහල්පතිතුමන්
ප්‍රමුඛ  මහනුවර ශාන්ත සිල්වෙස්තර විදුහලේ මගේ
ආදරණීය ගුරු මව් පිය වරුන්ටත්,
මෙවන් අවස්ථාවක් ලබාදුන් මහාමායා විදුහලේ
විදුහල්පති ප්‍රමුඛ ගුරු මව් පිය වරුන්ටත්
මගේ මෙම කෘතිය පුද කරමි.

තිසල දිනුලක වීරසිංහ .
ශාන්ත සිල්වෙස්තර විදුහල,
මහනුවර.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වාර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය පරම්පරාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයටද යොමුකරන “හෙණගත්කරණි” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.


විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එක ගම්මානයක් මැද්දට වෙන්න
ගස් වලින් පිරි ඉතා සශ්‍රික
කැලයක්තිබුණා.

ඔය කැලයේ එක එක වර්ගයේ ගස් කොලන් මෙන්ම විවිධ වර්ගයේ සත්වයින්ද සිටියා. මෙම කැලයේ ගස් කොලන් වලින් ආවරණය වුණු තැනක කූඹි විශාල පිරිසක් වාසය කරන කූඹි ගුලක් තිබුණා. මේ කූඹි ගුලේ කූඹි විශාල සංඛ්‍යාවක් ජීවත් වුණා.





මේ කූඹි ගුලේ එක කූඹියෙක් හිටියා එයා හරිම කම්මැලියි. ඉතින් මේ කම්මැලි කූඹියාගේ එකම රාජකාරිය උනේ අනික් කූඹියෝ වෙහෙස මහන්සි වෙලා හොයාගෙන එන කෑම කකා බිබී නිදාගන්න එක විතරමයි.

වියළි  කාලයේදී කූඹි ආහාර රැස් කර
ගැනීම සාමාන්‍යයෙන් දකින්නට ලැබෙන
දෙයක්.දැන් ශීත කාලයත් ලං වීගෙන
එනවා . ඉතින් මේ කූඹියෝ හරි සතුටින්
හිටියා. මොකද තමුන් ශීත  කාලයට
ගන්න කෑම රැස් කරලා ඉවර නිසා.



ඒත් ඉතින් ශිත  කාලයේ කෑම ගන්න කෑම ගබඩාවට ගිය කූඹින්ට දැක ගන්නට ලැබුණේ තමා රැස්  කළ කෑම ගබඩාවේ  කෑම බොහෝ  ප්‍රමාණයක් අඩු වී ඇති බවයි. තමන් ශිත කාලයට කෑම තියනවා කියලා සතුටු වූවාට තම කූඹි රැලට ප්‍රමාණවත් තරම් ආහාර නොමැති බව මෙයාලට තේරුනා.



එතකොට තමයි මෙයාලට තේරුනේ
කම්මැලි කූඹියා ගුහාවටම වෙලා කරලා
තියෙන්නේ මොකද්ද කියන කාරණය.
කම්මැලිකමට ගුහාවටම වෙලා හිටපු
යාලුවා අනික් කූඹි හැමෝටම ලොකු ද්‍රෝහී
කමක් කරලා තියන බව වැටහුණා.




ඒ නිසා කූඹි රැජින අර කම්මැලි කූඹියාව කූඹි ගුලියෙන් එළවලා දැම්මා. වැස්සේම එළියට බැස්ස කූඹියා හරිම දුකෙන් අඩ අඩා වනය අතුලේ එහා මෙහා ඇවිදිමින් සිටියා.




බඩගින්නෙම එහා මෙහා ඇවිදිමින් හිටපු
කූඹියාට තණකොළ පෙත්තෙක්
හමුවුණා.

මේ තණකොළ පෙත්තනම් හරිම
කරුණාවන්තයි.



තණකොළ පෙත්තා කැමති වුනා අසරණ වෙලා ඉන්න කූඹියාට උදවු කරන්න. මොකද අසරණ වුන කූඹියා දකිද්දී තණකොළ පෙත්තාට ලොකු දුකක් දැනුණා.



ඊට පස්සේ කූඹියාට උදව් කරන්න හිතාගෙන තණකොළ පෙත්තා කූඹියාව එයාගේ ගුරුවරයා ලගට එක්කගෙන ගියා. ඒ දෙන්නම ගියා තණකොළ පෙත්තගේ ගුරුතුමා වුන වයසක කුරුමිණියෙක් ලගට. කුරුමිණි ගුරුතුමා සිදු වුන සියලුම දේ අහලා දැන ගත්තා. ගුරුතුමාට තේරුණා සිදුවෙලා තිබුන දේ.



ගුරුතුමා කම්මැලි කූඹියාට පැහැදිලි කරලා දුන්නා එයාගේ ගුලේ හිටපු කූඹි යාළුවෝ කඩිසරව කෑම රැස් කලේ ශීත කාලයේදී ප්‍රයෝජනයට ගන්න බව. ඒත් කම්මැලිකමට ඔහු කල දේ නිසා අනික් හැමෝමත් අපහසුතාවයට ලක් වුන බව ගුරුතුමා පැහැදිලි කරලා දුන්නා. නැවත මෙසේ නොකරන්නැයි අවවාද කළා



ඊට පස්සේ කූඹියාට කම්මැලිකම් අත්හැර කඩිසරව ක්‍රියා කරන්නයි අවවාද කළා. එම උපදෙස පිළි පැදපු කූඹියාට කෑම වර්ග බොහොමයක් දී  තම ගුලට ගොස් අනෙක් අය සමග සහයෝගයෙන්, සතුටින්  හා සමගියෙන් ඉන්න කියා පිටත් කර යැවුවා.





ඉතින් මගේ යාලුවනේ අපිත් කම්මැළි නැතිව කඩිසරව, හොදින් හිතලා බලලා සමගියෙන් ක්‍රියා කරන්න ඕන. එතකොට අපිටත් ගොඩක් සතුටින් ජීවත් වෙන්න පුළුවන්. ඒ වගේම අපි අවට ඉන්න අයත් අපි එක්ක බොහොම සතුටින් ඉන්නවා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත්ත පරපුරේ හැකියාවන් ඔප්නැ0වීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.

එම බිජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂතත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂ්නාත්මක ව සනාථ වේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නුතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග , සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක ,**

**සෙනෙවිරත්න මහලේකම්.**

ISBN අංකය : 978-624-208-686-6